දිවයින
2020/08/17
පිටු අංක 02

# මේ වසරේ අවසන් කාර්තුවේදී ආර්ථිකය යථා තත්ත්වයට

## මහ බැංකුව විශ්වාසය පළ කරයි

ශ්‍යාම් නුවන් ගනේවත්ත

පළමු කාර්තුවේ සෘන වර්ධනයක් වාර්තා කළ ශ්‍රී ලංකා ආර්ථිකය මේ වසරේ 2020 අවසන් කාර්තුවේදී වේගයෙන් යථා තත්ත්වයට පත්වනු ඇතැයි මහ බැංකුව පවසයි.

කොවිඩ් - 19 වසංගතය හේතුවෙන් මෙරට දේශීය ආර්ථික ක්‍රියාකාරකම් දැඩි ලෙස බලපෑමට ලක් වූ බව ද මහ බැංකුව කියයි.

මෙසේ දැඩි බලපෑමට ලක් වූ දේශීය ආර්ථික ක්‍රියාකාරකම් මේ වසරේ (2020) දෙවන මාස හයේදී යථා තත්ත්වයට පත්වනු ඇතැයි අපේක්ෂා කරන බව ද මහ බැංකුව සඳහන් කරයි.

මේ සම්බන්ධයෙන් කරුණු පැහැදිලි කරන ශ්‍රී ලංකා මහ බැංකුවේ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව මෙසේ ද කියයි.

ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද තාවකාලික ඇස්තමේන්තුවලට අනුව ශ්‍රී ලංකා ආර්ථිකය, ශ්‍රී ලංකා මහ බැංකුව අපේක්ෂා කළ අගයෙන් වෙනස්ව 2020 පළමු කාර්තුවේදී සියයට 1.6 කින් සංකෝචනය විය. පවතින දර්ශකයන්ට අනුව 2020 දෙවන කාර්තුව තුළ ආර්ථික ක්‍රියාකාරකම් කෙරෙහි කොවිඩ් - 19 හි අහිතකර බලපෑම සැලකිය යුතු වේ යැයි අපේක්ෂා කෙරේ. කෙසේ වුවද වැඩිදියුණු වූ දේශපාලන ස්ථාවරත්වය සහ එමගින් ගොඩනැගුණු ව්‍යාපාරික විශ්වාසය මෙන්ම මුදල් හා රාජ්‍ය මූල්‍ය උත්තේජක ක්‍රියාමාර්ගවල පසු බලපෑමෙහි සහාය ලබමින් විශේෂයෙන් ම 2020 සිව්වන කාර්තුවේදී ආර්ථික ක්‍රියාකාරීත්වය වේගයෙන් යථා තත්ත්වයට පත් වීමක් අපේක්ෂා කෙරේ. ආනයන ආදේශනය සඳහා මෙන්ම අපනයනය සඳහා ද දේශීය නිෂ්පාදනය කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම මගින් සැලකිය යුතු දීර්ඝකාලීන බලපෑම් සහිතව ඉදිරි කෙටි කාලයේ ආර්ථික වර්ධනය ගොඩනැගෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙටි කාලයෙන් ඔබ්බට ආර්ථික වර්ධන වේගය අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා ආර්ථිකයේ ව්‍යුහාත්මක ගැටලු විසඳීමට ප්‍රතිසංස්කරණ අවශ්‍ය වේ.